සැ. යු. - 2025.09.19 වැනි දින පළ කරන ලද අංක 2455 *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,456 - 2025 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 238 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 239 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

පුත්තලම දිසා අධිකරණයේ දී ය

**පිස්කල් වෙන්දේසියේ විකිණීමයි**

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 75,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ .

............*පැමිණිලිකරු.*

නඩු අංකය : 167/MB
ඇස්කිසි අංකය -

*- එදිරිව -*

1. අන්තෝනිගේ ඇන් පද්මා ජෙනට්,
උතුරු කන්දකුලිය,
කන්දකුලිය.

සහ

කුඩාව,
කන්දකුලිය.

02. අඹගහේ අයිමන් නිහාල් ප්‍රනාන්දු,
උතුරු කන්දකුලිය,
කන්දකුලිය.

සහ

කුඩාව,
කන්දකුලිය.

............*විත්තිකරුවෝ.*

පුත්තලම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ වර්ෂ 2024.06.13 දින ප්‍රකාශයට පත් කරන ලද සමථ තීන්දුව ප්‍රකාරව 167/MB දරන නඩුව සඳහා ඉහත නම් සඳහන් විත්තිකරු එකහ වූ රු. 4,019,967.89 ක මුදල ගෙවීම පැහැර හැර විත්තිකරු සමථය කඩකර ඇති බැවින් එකී සමථය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ දැක්වෙන පරිදි විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු නඩු නිමිත්ත මත 2022.06.20 දිනට රු. 2,598,567.98 ක මුදලක් සහ රු.2,016,591.38 ක මුදල මත 2022.06.20 දින සිට 17.5%ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා පොළියක් සහ වෙන්දේසි ගාස්තු අයකර ගැනීම සඳහා මෙම අධිකරණය මගින් නිකුත් කර ඇති ඇස්කිසි ආඥාව ප්‍රකාරව තහනමට එන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළෙහි එම විත්තිකරුවන්ට අයත් සියලුම හිමිකම් හා අයිතිවාසිකම්,

**වර්ෂ 2025 ක් වූ ඔක්තෝබර් මස 30 වැනි දින පෙරවරු 11.30 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව සියල්ලන්ටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් විසින් ය.

*ඉඩමට පිවිසීම .–* කල්පිටිය නගරයේ සිට පාලවිය දෙසට 3Km ගිය පසු කුරුන්වත්පිටිය හන්දියෙන් දකුණට හැරී 1.5 Km ගිය පසුව දකුණු පස හමුවන ක්‍රීඩාපිටිය අසලින් දකුණට හැරී "කුඩාව" මාර්ගයට පිවිස, එම මාර්ගයේ දී 200m ගිය පසු හමුවන කුඩාව සාන්ත සෙබස්තියන් සිංහල විදුහල පසුකර හමුවන දකුණට වංගුවෙන් වමට හැරී 200m ක් ගිය පසු හමුවන තුංමං හන්දියෙන් නැවත දකුණු පසට හැරී තවත් 200m ගිය පසුව හමුවන මීළඟ තුංමං හන්දියේ අදාළ නිවස පවතී.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, කල්පිටිය කෝරළේ, කල්පිටිය පත්තුවේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, කන්දකුලිය ග්‍රාම සේවා නිලධාරි

කොට්ඨාසයට අයත්, කන්දකුලිය නැමැති ගමේ පිහිටි, කන්දකුලි තෝට්ටම් නමැති ඉඩමට, ජේ. ඒ. වී. රාජනායගම් බලයලත් මානක තැන විසින් 2000.07.19 දින මැන සාදන ලද අංක 4236 ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම්:

| | | |
|---|---|---|
| උතුරට | : | පී. පී. පු. 3169 පිඹුරේ ලොට් 25 දරන කොටස ද; |
| නැගෙනහිරට | : | පාර ද; |
| දකුණට | : | ඉහත පිඹුරේ ලොට් අංක 02 දරන කොටස ද; |
| බස්නාහිරට | : | පී. පී. පු. 3169 පිඹුරේ ලොට් 27 දරන කොටස ද, |

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටයි දශම අට ( රූඩ් 01, පර්. 8.8) ක් විශාල ඉඩමේ බිම් සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

ඉහත ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.

ඉහත කී කන්දකුලි නමැති ගමේ පිහිටි, කන්දකුලි තෝට්ටම් නැමැති ඉඩමට, ඒ. ඕ. එම්. නබ්ජි බලයලත් මානක තැන විසින් 2012.02.10 වැනි දින මැන සාදන ලද අංක 4299 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 02 දරන කොටස ද,

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටයි දශම අට (රූඩ්. 01, පර්. 8.8) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 01, පර්චස් 8.8

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,

දිසා අධිකරණය පුත්තලම,
2025 ක් වූ අගෝස්තු මස 07 වැනි දින දීය.

09-266

# විවිධ දැන්වීම්

**පාර්ලිමේන්තුව**

**යූඑන්වී පදනම**

**සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

ඉම්රාන් මහරූෆ් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "යූඑන්වී පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි." යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) ළමුන්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම;

(ආ) කාන්තාවන්ගේ සමාජයීය, ආර්ථික සහ අධ්‍යාපන දියුණුව සඳහා වෙනම ඒකකයක් පිහිටුවා එය නඩත්තු කිරීම;

(ඇ) ධීවර හා කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීමට ගොවීන්ට හා ධීවරයන්ට අවශ්‍ය උපකරණ සැපයීම,

යනාදිය වේ.

ඉම්රාන් මහරූෆ්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

09-217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.